කාන්තාවක් සම්බන්ධ වන යම් කිසි පුවතක් ඉදිරිපත් කිරීමේදී ඇතැම් මාධ්‍ය "රූමත්", "සුරූපී" වැනි විශේෂණ පද භාවිතා කරමින් එම කාන්තාවගේ බාහිර ස්වරූපය සඳහන් කිරීම හෝ භාවාතිෂය ලෙසින් ඉදිරිපත් කිරීම දැකිය හැකි කරුණකි. එය බොහෝ අවස්ථාවන්හිදී පුවතට අදාළ නොවේ. මෙය ස්ත්‍රී පුරුෂ භාවය මත පදනම් වෙමින් කාන්තාව කොන් කිරීමකි.

ඇතැම් මාධ්‍ය මගින් පුවතට ඍජුව අදාළ නොවන මෙවැනි සුරූපී, රූමත් වැනි විශේෂණ පද යොදාගන්නේ පාඨකයන්ව ආකර්ෂණය කරගැනීම උදෙසාද? එසේ වුවත්, ඒ ඔස්සේ කාන්තාව ස්ත්‍රී-පුරුෂ භාවය මත පදනම් වෙමින් කොන් වීමකට ලක්වීම සාධාරණද? මෙය මාධ්‍ය ආචාර ධර්ම විරෝධී මාධ්‍යකරණයක් නොවන්නේද?
#MediaEthicsSL #lka #SinhalaPress #Lankadeepa #Divaina #SundayDivaina #Aruna